(iii) දී ඇති ඕනෑම $T$ උෂ්ණත්වයකදී **A** සහ **B** වායු දෙකෙහි මවුලික චාලක ශක්තීන් අතර අනුපාතය සඳහා ප්‍රකාශනයක් ව්‍යුත්පන්න කරන්න.

උෂ්ණත්වය T වලදී මවුලයක් සඳහා චාලක ශක්තිය (KE) $= \frac{3RT}{2}$

A වායුව සඳහා: $(KE)_A = \frac{3RT_A}{2}$ **(04)**

B වායුව සඳහා: $(KE)_B = \frac{3RT_B}{2}$ **(04)**

As $T_A = T_B$: $(KE)_A = (KE)_B$ **(04)**

| |
|---|
| හෝ වායුවක චාලක ශක්තිය (නිරපේක්ෂ) උෂ්ණත්වය මත රඳා පවතී. |
| $(KE)_A = (KE)_B$ **(12)** |

**6(a): ලකුණු 40**



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

(*b*) (i) 'ප්‍රාථමික ප්‍රතික්‍රියාවක්' යන පදය අර්ථ දක්වන්න.

මූලික ප්‍රතික්‍රියාව : තනි පියවරකින් පමණක් සිදුවන ප්‍රතික්‍රියාව (අතරමැදියක් සහභාගි නොවන) **(05)***

(ii) ප්‍රතික්‍රියාවක 'අණුකතාවය' යන පදය අර්ථ දක්වන්න.

අණුකතාවය : මූලික ප්‍රතික්‍රියාවක් සඳහා හෝ ප්‍රතික්‍රියාවක වේග නිර්ණ පියවර සඳහා සහභාගිවන මුළු ප්‍රතික්‍රියක අණු සංඛ්‍යාව **(05)**

(iii) ප්‍රාථමික ප්‍රතික්‍රියාවක් සඳහා 'ප්‍රතික්‍රියා පෙළ' සහ 'අණුකතාවය' අතර සම්බන්ධතාවය කුමක් ද?

**(05)***

මූලික ප්‍රතික්‍රියාව : ප්‍රතික්‍රියාවේ පෙළ = අණුකතාව

(iv) ප්‍රතික්‍රියාවක ප්‍රතික්‍රියකයේ සාන්ද්‍රණය කාලය සමග වෙනස්වන අයුරු පහත සඳහන් වගුවේ දක්වා ඇත.

| කාලය (මිනිත්තු) | 0 | 10 | 20 | 30 | 40 |
|---|---|---|---|---|---|
| ප්‍රතික්‍රියක සාන්ද්‍රණය ($mol\ dm^{-3}$) | 1.6 | 0.8 | 0.4 | 0.2 | 0.1 |

I. ප්‍රතික්‍රියාවේ පෙළ නිර්ණය කරන්න.

II. ප්‍රතික්‍රියාවේ අර්ධ-ජීව කාලය සඳහන් කරන්න.

**(05)**

මිනිත්තු 10 දී සාන්ද්‍රණය ආරම්භක සාන්ද්‍රණයෙන් අඩක් වේ. **(05)**

මෙය මිනිත්තු 10 යේ කාල පරාසවලින් සමන්විත වේ.

**(05)**

I) ප්‍රතික්‍රියාව පළමු පෙළ වේ. **(05)**

II) ප්‍රතික්‍රියාවේ අර්ධ ආයු කාලය මිනිත්තු 10 ක් වේ.

*** ශිෂ්‍යයකු ප්‍රශ්න අංක 6(b) සඳහා උත්සාහ කර ඇත්නම්, (i) සහ (iii) කොටස් සඳහා ලකුණු ප්‍රදානය කරන්න.**

(v) දෙන ලද උෂ්ණත්වයකදී, ① සහ ② පළමු පෙළ ප්‍රතික්‍රියාවන් දෙකක් සඳහා පහත දී ඇති තොරතුරු සලකන්න.

| ප්‍රතික්‍රියාව | ප්‍රතික්‍රියා ශීඝ්‍රතාව/ $mol\ dm^{-3}\ s^{-1}$ | ශීඝ්‍රතා නියතය/$s^{-1}$ | අර්ධ-ජීව කාලය/s |
|---|---|---|---|
| ①: $A \rightarrow P_1$ | $r_A$ | $k_A$ | $(t_{1/2})_A$ |
| ②: $B \rightarrow P_2$ | $r_B$ | $k_B$ | $(t_{1/2})_B$ |

($P_1, P_2$ = ඵල)

වේග නියතය $k$ වූ පළමු පෙළ ප්‍රතික්‍රියාවක් සඳහා අර්ධ-ජීව කාලය, $t_{1/2} = \frac{0.693}{k}$ වේ.

$[B] = 2[A]$ වූ විට $r_B = 3r_A$ නම්, $2(t_{1/2})_A = 3(t_{1/2})_B$ බව පෙන්වන්න.

මෙවා පළමු පෙළ ප්‍රතික්‍රියා නිසා,

$r_A = k_A[A]$: $k_A = \frac{r_A}{[A]}$ **(03+0**

$r_B = k_B[B]$: $k_B = \frac{r_A}{[B]}$ **(03+0**

$[B] = 2[A]$, $r_B = 3r_A$ $and$ $t_{1/2} = \frac{0.693}{k}$ දී ඇත



Download all Past Papers at: https://bookbeekid.com/resource/past-papers/

$$k_A = \frac{r_A}{[A]} \;\ldots\ldots..(I)$$

$$k_B = \frac{3r_A}{2[A]} \;\ldots\ldots(II)$$ ලෙස ලිවිය හැක (05)

(I)÷(II) $\frac{k_A}{k_B} = \frac{2}{3}$ ලබා දේ (05+05)

$$\frac{(t_{1/2})_A}{(t_{1/2})_B} = \frac{0.693/k_A}{0.693/k_B} = \frac{k_B}{k_A} = \frac{3}{2}$$ (05+05)

$$\mathbf{2(t_{1/2})_A = 3(t_{1/2})_B}$$ (05)

**6(b): ලකුණු 75**

(c) උෂ්ණත්වය 25 °C දී 0.30 g dm$^{-3}$ ජලීය අයඩීන් ද්‍රාවණයකින් 50.0 cm$^3$, $CCl_4$ 10.0 cm$^3$ සමග හොඳින් සොලවන ලදී. පද්ධතිය සමතුලිතතාවයට එළඹි විට ජල ස්ථරයේ අයඩීන් සාන්ද්‍රණය 0.02 g dm$^{-3}$ බව සොයාගන්නා ලදී.

(i) සමතුලිතතාවයේදී $CCl_4$ ස්ථරයේ අයඩීන් සාන්ද්‍රණය ගණනය කරන්න.

ජලීය ස්ථරයේ ආරම්භක $I_2$ ස්කන්ධය = 0.30 g dm$^{-3}$ × 50 × 10$^{-3}$ dm$^3$ = 0.015 g (03)

ජලීය ස්ථරයේ සමතුලිත $I_2$ ස්කන්ධය = 0.02 g dm$^{-3}$ × 50 × 10$^{-3}$ dm$^3$ = 0.001 g (03)

සමතුලිත අවස්ථාවේ $[I_2]_{H_2O} = \frac{(0.001\,g)}{50 \times 10^{-3} dm^3} = 0.02\,g\,dm^{-3}$

$CCl_4$ ස්ථරයේ සමතුලිත $I_2$ ස්කන්ධය $= (0.015 - 0.001)g = 0.014\,g$ (03)

සමතුලිත අවස්ථාවේ $[I_2]_{CCl_4} = \frac{(0.014\,g)}{10 \times 10^{-3} dm^3} = \mathbf{1.4\,g\,dm^{-3}}$ (03+03+01)

(ii) උෂ්ණත්වය 25 °C දී, $CCl_4$ සහ ජලය අතර $I_2$ වල විභාග සංගුණකය ගණනය කරන්න.

$$K_D = \frac{[I_2]_{CCl_4}}{[I_2]_{H_2O}} = \frac{1.4\,g\,dm^{-3}}{0.02\,g\,dm^{-3}} = \mathbf{70}$$ (03+03)

(iii) ඉහත පරීක්ෂණය 25 °C දී, $CCl_4$ 10.0 cm$^3$ වෙනුවට 20.0 cm$^3$ යොදා කළේ නම් සමතුලිතතාවයේදී ජල ස්ථරයේ අයඩීන් සාන්ද්‍රණය ගණනය කරන්න.

මෙම අවස්ථාවේදී ජලීය ස්ථරයෙහි අඩංගු $I_2$ ස්කන්ධය x ලෙස සලකමින්

$$K_D = 70 = \frac{[I_2]_{CCl_4}}{[I_2]_{H_2O}} = \frac{(0.015-x)/20}{x/50}$$ (05)

$$x = 0.0005g$$ (04)

$$[I_2]_{H_2O} = \frac{(0.0005\,g)}{50 \times 10^{-3} dm^3} = \mathbf{0.01\,g\,dm^{-3}}$$ (03+01)

**6(c): ලකුණු 35**

**විකල්ප පිළිතුර:**

මෙම අවස්ථාවේදී $CCl_4$ ස්ථරයෙහි අඩංගු $I_2$ ස්කන්ධය x ලෙස සලකමින්

$$K_D = 70 = \frac{[I_2]_{CCl_4}}{[I_2]_{H_2O}} = \frac{x/20}{(0.015-x)/50}$$ (05)

$$x = 0.0145\,g$$ (02)

ජලීය ස්ථරයේ $I_2$ ස්කන්ධය = 0.0150 − 0.0145 = 0.0005 g (02)

$$[I_2]_{H_2O} = \frac{(0.0005\,g)}{50 \times 10^{-3} dm^3} = \mathbf{0.01\,g\,dm^{-3}}$$ (03+01)



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

7.(*a*) නිෂ්ක්‍රිය ඉලෙක්ට්‍රෝඩ (උදාහරණ :Pt, ග්‍රැෆයිට්) භාවිත කර විලීන $MgCl_2(l)$ විද්‍යුත් විච්ඡේදනයෙන් Mg ලෝහය නිස්සාරණය කළ හැක. මේ සඳහා වූ සරල ඇටවුමක් රූපයේ දක්වා ඇත.

$$E^{\circ}_{Mg^{2+}(l)/Mg(s)} = -2.37\ V$$

$$E^{\circ}_{H_2O(l)/H_2(g)} = -0.63\ V$$




විද්‍යුත් විච්ඡේදන කෝෂය

(i) ඇනෝඩය හා කැතෝඩය හඳුනාගන්න. එක් එක් ඉලෙක්ට්‍රෝඩයෙහි සිදුවන අර්ධ ප්‍රතික්‍රියාව ලියන්න.

**සටහන : භෞතික අවස්ථා අනිවාර්ය වේ.**

| ඉලෙක්ට්‍රෝඩය | අර්ධ - ප්‍රතික්‍රියාව | |
|---|---|---|
| ඇනෝඩය : C(ග්‍රැෆයිට්, s)\|$Cl_2$(g)\|$MgCl_2(l)$ | $2Cl^-(l) \rightarrow Cl_2(g) + 2e$ | **(05+05)** |
| කැතෝඩය: Pt(s)\|Mg(s)\|$MgCl_2(l)$ | $Mg^{2+}(l) + 2e \rightarrow Mg(s)$ හෝ $Mg(l)$ | **(05+05)** |

**හෝ** $MgCl_2(l) \rightarrow Mg(s)/(l) + Cl_2(g)$ **(05)**

(ii) සම්පූර්ණ කෝෂ ප්‍රතික්‍රියාව ලියන්න.

සම්පූර්ණ කෝෂ ප්‍රතික්‍රියාව:

$$Mg^{2+}(l) + 2Cl^-(l) \rightarrow Mg(s)/(l) + Cl_2(g)$$

**හෝ** $MgCl_2(l) \rightarrow Mg(s)/(l) + Cl_2(g)$ **(05)**

(iii) කෝෂය ක්‍රියා කිරීමේදී බාහිර පරිපථය තුළින් ඉලෙක්ට්‍රෝන ධාරාව ගලන දිශාව සඳහන් කරන්න.

C(ග්‍රැෆයිට්, s)|$Cl_2$(g)ඇනෝඩයේ සිට Pt(s)|Mg(s) කැතෝඩය දක්වා **(05)**

(iv) පහත සඳහන් දෑ පහදන්න.

I. මෙම නිස්සාරණ ක්‍රියාවලියේදී $MgCl_2(s)$ වෙනුවට විලීන $MgCl_2(l)$ භාවිත කෙරේ.

II. මෙම නිස්සාරණ ක්‍රියාවලියේදී $MgCl_2(aq)$ ද්‍රාවණයක් භාවිත කළ නොහැක.

I. ඝණ හෝ ස්ඵටික $MgCl_2(s)$ හි සචල අයන නොමැත විලීන අවස්ථාවේ $Mg^{2+}(l)$ සහ $Cl^-(l)$ අයන ඇත. **(05**

II. $Mg^{2+}(l)$ ඔක්සිහරණය වෙනුවට ජලය ඔක්සිහරණයෙන් $H_2(g)$ ලබා දේ **(05**



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

(v) මෙම කෝෂය තුළින් 5.37 A ධාරාවක් පැයක කාලයක් යවා සෑදෙන $Cl_2$ (g) උෂ්ණත්වය 300 K සහ පීඩනය 1 atm (~ $1.0 \times 10^5$ Pa) යටතේ එකතු කරගන්නා ලද්දේ නම්, නිපදවෙන $Cl_2$ (g) හි පරිමාව $dm^3$ වලින් ගණනය කරන්න. (1 F = 96 500 C)

$Q = It$ (05)

$= 5.37\,A \times (60 \times 60) = 19300\,C$ (04+1)

ඉලෙක්ට්‍රෝන මවුල = 19300/96500 = 0.2 mol (05)

ඉලෙක්ට්‍රෝන 2 mol ≡ $Cl_2$(g) 1 mol

සෑදෙන $Cl_2$(g) මවුල = 0.10 mol (05)

පරිපූර්ණ වායුවක් ලෙස උපකල්පනය කිරීමෙන් : PV = nRT (05)

$$V = \frac{nRT}{P} = \frac{0.10\,mol \times 8.314\,Jk^{-1}mol^{-1} \times 300\,K}{1 \times 10^5\,Pa}$$ (05)

$$= 249.4 \times 10^{-5}\,m^3 \text{ හෝ } 2.49\,dm^3$$ (04+01)

**7(a): ලකුණු 75**

(b) (i) **P, Q, R, S** හා **T** යනු Co(III) හි සංගත සංයෝග වේ. ඒවාට අෂ්ටතලීය ජ්‍යාමිතියක් ඇත. පහත දී ඇති ලැයිස්තුවෙන් සුදුසු විශේෂ තෝරා ගනිමින් මෙම සංගත සංයෝගයන්හි ව්‍යුහ සූත්‍ර දෙන්න හෝ ව්‍යුහ අඳින්න.

$Co^{3+}$, $K^+$, $NH_3$, $SO_4^{2-}$, $NO_2^-$, $Cl^-$

සටහන : ඉහත සංගත සංයෝගවල $NO_2^-$ ලෝහ අයනයට සම්බන්ධ වන විට ඒක-බන්ධන ලිගනයක් ලෙස හැසිරේ.

**P** – උදාසීන ලිගන පමණක් ලෝහ අයනයට සංගත වී ඇත. **P** හි ජලීය ද්‍රාවණයක් තනුක HCl සමග ප්‍රතික්‍රියා කළ විට රතු-දුඹුරු දුමාරයක් පිට වේ. ජලීය ද්‍රාවණයේදී **P**, අයන හතරක් දෙයි.

**Q** – ලිගන වර්ග දෙකක් ලෝහ අයනයට සංගත වී ඇත. ඒවා උදාසීන ලිගන හා ඒක-පරමාණුක ඇනායනික ලිගන වේ. **Q** හි ජලීය ද්‍රාවණයකට $BaCl_2$(aq) එක් කළ විට, තනුක අම්ලවල අද්‍රාව්‍ය සුදු අවක්ෂේපයක් සෑදේ. ජලීය ද්‍රාවණයේදී **Q**, අයන දෙකක් ලබාදෙයි.

**R** – ලිගන වර්ග දෙකක් ලෝහ අයනයට සංගත වී ඇත. ඒවා උදාසීන ලිගන හා බහු-පරමාණුක ඇනායනික ලිගන වේ. **R** ජ්‍යාමිතික සමාවයවිකතාවය පෙන්වයි. **R** හි ජලීය ද්‍රාවණයක් $AgNO_3$(aq) සමග ප්‍රතික්‍රියා කළ විට සුදු අවක්ෂේපයක් සෑදේ. එම අවක්ෂේපය තනුක $NH_4OH$ හි ද්‍රාව්‍ය වේ. ජලීය ද්‍රාවණයේදී **R**, අයන දෙකක් ලබාදෙයි.

**S** – මෙය අයනික නොවන සංයෝගයකි. උදාසීන ලිගන හා බහු-පරමාණුක ඇනායනික ලිගන සමාන ගණනක් ලෝහ අයනයට සංගත වී ඇත.

**T** – ඒක-පරමාණුක ඇනායනික ලිගන පමණක් ලෝහ අයනයට සංගත වී ඇත. ජලීය ද්‍රාවණයේදී **T**, අයන හතරක් දෙයි.

**(i)**

**P :** $[Co(NH_3)_6](NO_2)_3$ **(10)**

**Q:** $[Co(NH_3)_5Cl]SO_4$ **(10)**

**R:** $[Co(NH_3)_4(NO_2)_2]Cl$ **(10) ***

**S:** $[Co(NH_3)_3(NO_2)_3]$ **(10)**

**T:** $K_3[CoCl_6]$ **(10)**

**(7 (b) (i) ලකුණු 50)**



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

(ii) I. **T** හි IUPAC නාමය ලියන්න.

potassium hexachloridocobaltate(III)

**(10)**

II. **R** හි ජ්‍යාමිතික සමාවයවිකයන්හි ව්‍යුහ අඳින්න.







**(05)***

(ව්‍යුහ දෙකම නිවැරදි නම් ලකුණු 05ක්. ව්‍යුහ එකක් පමණක් නිවැරදි නම් ලකුණු 03ක්)

*සටහන : ජ්‍යාමිතික සමාවයවිකතාව සාමාන්‍යයෙන් උසස් පෙළ වලදී උගන්වනු ලැබුවද, බණ්ඩාංක සංකීර්ණ වලදී සිසුන් ඒවා ගැන හුරුපුරුදු නොවිය හැකිය. එබැවින්, සහනයක් ලෙස, **7 b (i) R** සහ **(ii) II** සඳහා පහත පරිදි ලකුණු ප්‍රදානය කෙරේ.

**(i) R:** $[Co(NH_3)_5(SO_4)]Cl$ **(06)**

**(ii) II.**




**(03)**

(iii) **X** යනු අෂ්ටතලීය ජ්‍යාමිතියක් සහිත Co(III) හි සංගත සංයෝගයක් වේ. $H_2O$ හා $CO_3^{2-}$ ලිගන ලෝහ අයනයට සංගත වී ඇත. **X** හි ජලීය ද්‍රාවණයක් $AgNO_3(aq)$ සමග මිශ්‍රණය කළ විට සාන්ද්‍ර $NH_4OH$ හි ද්‍රාව්‍ය ලා-කහ අවක්ෂේපයක් සෑදේ. ජලීය ද්‍රාවණයේදී **X**, අයන දෙකක් දෙයි. **X** හි ව්‍යුහ සූත්‍රය දෙන්න හෝ ව්‍යුහය අඳින්න.

සටහන : $CO_3^{2-}$ ඔක්සිජන් පරමාණු දෙකක් මගින් ලෝහ අයනයට සංගත වේ.

$[Co(H_2O)_4(CO_3)]Br$ **(10)**

**7(b): ලකුණු 75**



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

## C කොටස — රචනා

ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න. (එක් එක් ප්‍රශ්නයට ලකුණු 150 බැගින් ලැබේ.)

8. (a) එකම කාබනික ආරම්භක ද්‍රව්‍යය ලෙස එතනෝල් භාවිත කරමින් V සංයෝගය සෑදීම පිණිස වූ ප්‍රතික්‍රියා අනුක්‍රමයක් පහත දී ඇත.




P, Q, R, S, T සහ U සංයෝගයන්හි ව්‍යුහ ඇඳීමෙන් සහ ප්‍රතික්‍රියා 1 - 6 සඳහා සුදුසු ප්‍රතිකාරක, දී ඇති ලැයිස්තුවෙන් **පමණක්** තෝරාගෙන ලිවීමෙන්, ඉහත දී ඇති ප්‍රතික්‍රියා අනුක්‍රමය සම්පූර්ණ කරන්න.

**ප්‍රතිකාරක:**
තනුක $H_2SO_4$, Mg/වියළි ඊතර, $PBr_3$, පිරිඩිනියම් ක්ලෝරොක්‍රෝමේට් (PCC)




*Q හි ව්‍යුහය දී නොමැති නම් හෝ වැරදි නම්, නමුත් එය ප්‍රතිකාරයක් ලෙස සුදුසු ස්ථානයකදී **නිවැරදිව** භාවිතා කර ඇත්නම් එක්වරක් පමණක් **ලකුණු** 06 ක් ප්‍රදානය කරන්න.

**සටහන :** Q හි ව්‍යුහය දී නොමැති නම් හෝ වැරදි නම්, ලකුණු දීමේ පටිපාටිය අනුව පිළිතුරෙහි ඉතිරි කොටස සඳහා ලකුණු ලබා දෙන්න.

**8(a): ලකුණු 60**



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

(b) (i) පහත දැක්වෙන පරිවර්තනය හතරකට (04) නොවැඩි පියවර සංඛ්‍යාවකින් සිදු කරන ආකාරය පෙන්වන්න.







*මෙතනෝල් ප්‍රතික්‍රියාව සඳහා අවශ්‍ය වේ. මෙතනෝල් ලියා නොමැති නම් ලකුණු 01 ක් අඩු කරන්න.

** මෙයට දැනට විෂය නිර්දේශයෙහි සහ ගුරු මාර්ගෝපදේශයෙහි සඳහන් නොවන අතර, එය යල් පැන ගිය ක්‍රමයකි නමුත් සමහර පාසල්වල තවමත් මෙය ඉගැන්වීම සිදු කරන බව පෙනී යයි. මෙය සිසුන්ට සාධාරණයක් කිරීම පිණි ලකුණු ලබා දීමේ පටිපාටියේ ඇතුළත් කර ඇත.

(ලකුණු 25)

**විකල්ප පිළිතුර :**

ගුරු මාර්ගෝපදේශයේ බෙන්සීන් බෙන්සැල්ඩිහයිඩ් බවට පරිවර්තනය කිරීම විෂය නිර්දේශයේ හෝ ගු මාර්ගෝපදේශයේ දී නොමැති අතර, සමහර පාසල්වල තවමත් මෙය ඉගැන්වීමසිදු කරන බව පෙනී යයි. එබැවි සාධාරණයක් සිදුවන පරිදි ලකුණු ලබාදීමේ පටිපාටියෙහි විකල්ප ක්‍රමයක් ලෙස මෙය ඇතුළත් කර ඇත.




(ලකුණු 2



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

(ii) දෙකකට (02) නොවැඩි පියවර සංඛ්‍යාවක් භාවිත කරමින් ඇනිලීන්වලින්,  සාදාගැනීම සඳහා ක්‍රමයක් යෝජනා කරන්න.




(ලකුණු 15)

**8(b): ලකුණු 40**

(c) (i) නිර්ජලීය $FeBr_3$ හමුවේ දී බෙන්සීන් සහ බ්‍රෝමීන් අතර සිදුවන ප්‍රතික්‍රියාවේ ඵලය සහ යාන්ත්‍රණය ලියන්න.

$Br_2 + FeBr_3 \longrightarrow Br-\overset{+}{Br}-\overset{-}{Fe}Br_3$ හෝ $\overset{+}{Br}\ \overset{-}{Fe}Br_4$ හෝ $Br-\overset{+}{Br}\ \overset{-}{Fe}Br_3$ හෝ $Br-\overset{\delta+\ \delta-}{Br}\ FeBr_3$ (04)




(ලකුණු 26)

(ii) බෙන්සීන් සහ ඇනිලීන්වල සම්ප්‍රයුක්ත ව්‍යුහ අඳින්න.

බෙන්සීන්හි සම්ප්‍රයුක්ත ව්‍යුහ




Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

ඇනලීන්හි සම්ප්‍රයුක්ත ව්‍යුහ



**සටහන:** එකසර ඉලෙක්ට්‍රෝන යුගල දක්වා නොමැති නම්, එක් වරක් පමණක් **ලකුණු 02ක්** අඩු කරන්න.

**(ලකුණු 02 x 7 = ලකුණු 14)**

(iii) ඇනිලීන්හි බෙන්සීන් න්‍යෂ්ටිය ඉලෙක්ට්‍රෝෆිලික ආදේශ ප්‍රතික්‍රියා කෙරෙහි බෙන්සීන්වලට වඩා ප්‍රතික්‍රියාශීලී වන්නේ මන්දැයි ඉහත සම්ප්‍රයුක්ත ව්‍යුහ සලකමින් පැහැදිලි කරන්න.

නයිට්‍රජන්(N) පරමාණුවේ තනි ඉලෙක්ට්‍රෝන යුගලය ඇනිලීන් හි බෙන්සීන් වලයට විස්ථානගත වීම **(ලකුණු 03)** හේතුවෙන් ඇනිලීන් හි බෙන්සීන් වලය බෙන්සීන් හා සසඳන විට ඉලෙක්ට්‍රෝන වලින් පොහොසත් වේ. **(ලකුණු 03)**

එබැවින්, ඇනිලීන් හි බෙන්සීන් වලය බෙන්සීන් වලට වඩා ඉලෙක්ට්‍රෝෆයිල කෙරෙහි ප්‍රතික්‍රියාශීලී වේ.

**(ලකුණු 06)**

(iv) ඇනිලීන්, බ්‍රෝමීන් සමඟ ප්‍රතික්‍රියා කළ විට සෑදෙන ඵලයේ ව්‍යුහය අඳින්න.



**(ලකුණු 04)**

**8(c): ලකුණු 50**



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

**9.** (*a*) පහත දී ඇති ප්‍රශ්නය කැටායනවල ගුණාත්මක විශ්ලේෂණය මත පදනම් වේ.

**M** නැමැති ජලීය ද්‍රාවණයක **A, B, C** සහ **D** යන එක් එක් ලෝහයෙහි කැටායනයක් බැගින් අඩංගු වේ.

පහත දී ඇති පටිපාටිය අනුව **M** විශ්ලේෂණය කරනු ලැබේ.

කොටුව තුළ දී ඇති සංකේත මගින් අවක්ෂේපය සහිත ද්‍රාවණය, ඝන ද්‍රව්‍ය, ද්‍රාවණ සහ වායු නිරූපණය වේ.







$A_1$–$A_4$, $B_1$–$B_3$, $C_1$–$C_4$ සහ $D_1$–$D_5$ යනු **A, B, C** සහ **D** ලෝහවල කැටායන හතරෙහි සංයෝග/විශේෂ වේ. **X** වායුවකි.

$A_1$, $A_2$, $A_3$, $A_4$, $B_1$, $B_2$, $B_3$, $C_1$, $C_2$, $C_3$, $C_4$, $D_1$, $D_2$, $D_3$, $D_4$, $D_5$ සහ **X** හඳුනාගන්න.

(සටහන : රසායනික සූත්‍ර **පමණක්** ලියන්න. රසායනික සමීකරණ සහ හේතු අවශ්‍ය නැත.)



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

**9.** (a)

| | | |
|---|---|---|
| **$A_1$:** | CuS | **(06)** |
| **$A_2$:** | $Cu(OH)_2$ | **(04)** |
| **$A_3$:** | $[Cu(NH_3)_4]^{2+}$ | **(04)** |
| **$A_4$:** | $[CuCl_4]^{2-}$ | **(04)** |
| **$B_1$:** | $Cr(OH)_3$ | **(06)** |
| **$B_2$:** | $Na_2CrO_4$ | **(04)** |
| **$B_3$:** | $Na_2Cr_2O_7$ | **(04)** |
| **$C_1$:** | MnS | **(06)** |
| **$C_2$:** | $[Mn(H_2O)_6]^{2+}$ | **(04)** සටහන: $Mn^{2+}(aq)$ නම් ලකුණු 02ක් පමණි. |
| **$C_3$:** | $Mn(OH)_2$ | **(04)** |
| **$C_4$:** | $[MnCl_4]^{2-}$ | **(04)** |
| **$D_1$:** | $CaCO_3$ | **(06)** |
| **$D_2$:** | CaO | **(04)** |
| **$D_3$:** | $Ca(OH)_2$ | **(04)** |
| **$D_4$:** | $CaSO_4$ | **(04)** |
| **$D_5$:** | $Ca(HCO_3)_2$ | **(04)** |
| **X:** | $CO_2$ | **(03)** |

**(ලකුණු 06 x 4 + ලකුණු 04 x 12 + ලකුණු 03 x 1)**

**9(a): ලකුණු 75**



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

(b) අයන් පයිරයිට්වල ඇති ප්‍රධාන සංයෝගය $FeS_2$ වේ. අයන් පයිරයිට් 1.50 g සාම්පලයක් විද්‍යාගාර තත්ව යටතේ ඔක්සිකරණය කර $FeS_2$ හි ඇති සල්ෆර් සියල්ල $SO_4^{2-}$ බවට පරිවර්තනය කරන ලදී. මෙහිදී ලැබෙන $SO_4^{2-}$, $BaSO_4$ ලෙස අවක්ෂේප කරන ලදී. ලැබුණු $BaSO_4$ හි වියළි බර 4.66 g විය.

(i) අයන් පයිරයිට්වල ඇති $FeS_2$ හි බර ප්‍රතිශතය ගණනය කරන්න.

අයන් පයිරයිට් 20.0 g හි ඇති $FeS_2$ පාංශු ක්ෂුද්‍රජීවීන් මගින් ස්වභාවික තත්ව යටතේ පැය 120 ක් ඔක්සිකරණයට භාජනය කරන ලදී.

මෙම ඔක්සිකරණ ප්‍රතික්‍රියාව පහත සමීකරණයෙන් නිරූපණය කර ඇත.

$$4FeS_2(s) + 15O_2(g) + 14H_2O(l) \xrightarrow{\text{පාංශු ක්ෂුද්‍රජීවීන්}} 4Fe(OH)_3(s) + 8H_2SO_4(aq)$$

පැය 120 කට පසුව මෙම ප්‍රතික්‍රියාවෙන් නිපදවෙන $H_2SO_4$ ප්‍රමාණාත්මකව වෙන් කරගෙන $BaSO_4$ ලෙස අවක්ෂේප කරන ලදී. ලැබුණු $BaSO_4$ හි වියළි බර 31.13 g විය.

$BaSO_4$ හි මවුලික ස්කන්ධය = 137 + 32 + 64 = 233 g mol-1 **(03)**

$FeS_2$ හි මවුලික ස්කන්ධය = 56 + 64 = 120 g mol-1 **(03)**

$BaSO_4$ හි මවුල $= \frac{4.66}{233} = 0.02$ mol **(03)**

$FeS_2$ හි මවුල 1 ක් $BaSO_4$ හි මවුල 2 ක් ලබා දෙයි **(03)**

$\therefore FeS_2$ හි මවුල $= \frac{0.02}{2} = 0.01$ mol **(03)**

$\therefore FeS_2$ හි බර = 0.01 x 120 = 1.20 g **(03)**

$\therefore$ යකඩ පයිරයිට් වල $FeS_2$ හි බර ප්‍රතිශතය $= \frac{1.20}{1.50} \times 100$ **(03)**

= 80% **(04)**

**(9b(i): ලකුණු 25)**

(ii) පාංශු ක්ෂුද්‍රජීවීන් මගින් පැය 120 කට පසුව අයන් පයිරයිට්හි ඇති $FeS_2$, $SO_4^{2-}$ බවට පරිවර්තනය වීමේ ප්‍රතිශතය ගණනය කරන්න.

$FeS_2$ 4 mol → $H_2SO_4$ 8 mol → $BaSO_4$ 8 mol

යකඩ පයිරයිට් 20.0g ක $FeS_2$ ප්‍රමාණය $= 20.0 \times \frac{80}{100}$ **(03)**

= 16.0 g **(03)**

$BaSO_4$ හි සෛධාන්තික ස්කන්ධය ගණනය කිරීම
සමීකරණයට අනුව

$FeS_2$ හි මවුල 4 ක් $BaSO_4$ මවුල 8 ක් ලබා දෙයි **(03)**

$\therefore$ $FeS_2$ 4 x 120 g $BaSO_4$ 8 x 233 g ලබා දෙයි **(03)**

$\therefore$ $FeS_2$ 16 g $BaSO_4$ $\frac{8 \times 233}{4 \times 120} \times 16$ g ලබා දෙයි **(03)**

$BaSO_4$ හි සෛධාන්තික ස්කන්ධය = 62.13 g **(03)**

$BaSO_4$ හි පරීක්ෂණාත්මක ස්කන්ධය = 31.13 g

% පරිවර්තනය $= \frac{31.13}{62.13} \times 100$ **(03)**

= 50.1% **(04)**

**(9b(ii): ලකුණු 25)**



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

<u>විකල්ප පිළිතුර 01</u>

$FeS_2$ 4 mol → $H_2SO_4$ 8 mol → $BaSO_4$ 8 mol

යකඩ පයිරයිට් 20.0 g ක $FeS_2$ ස්කන්ධය $= 20.0 \times \frac{80}{100}$ (03)

$= 16.0$ g (03)

$BaSO_4$ මවුල $= \frac{31.13}{233}$ mol

$H_2SO_4$ මවුල $= \frac{31.13}{233}$ mol (03)

ප්‍රතික්‍රියා කළ $FeS_2$ $= \frac{1}{2} \times \frac{31.13}{233}$ mol (03)

පරීක්ෂණාත්මක ප්‍රතික්‍රියා කළ $FeS_2$ ස්කන්ධය $= \frac{1}{2} \times \frac{31.13}{233}$ mol $\times$ 120 g $mol^{-1}$ (03)

$= 8.016$ g (03)

% පරිවර්තනය $= \frac{8.016g}{16g} \times 100\%$ (03)

$= 50.1\%$ (04)

**(9b(ii): ලකුණු 25)**

<u>විකල්ප පිළිතුර 02</u>

$FeS_2$ 4 mol → $H_2SO_4$ 8 mol → $BaSO_4$ 8 mol

යකඩ පයිරයිට් 20.0g ක $FeS_2$ ස්කන්ධය $= 20.0\, g \times \frac{80}{100}$ (03)

$= 16.0$ g (03)

$FeS_2$ මවුල $= \frac{16.0}{120}$ mol (03)

$BaSO_4$ හි සෛද්ධාන්තික ස්කන්ධය $= \frac{16}{120} \times 2$ mol $\times$ 233 g $mol^{-1}$ (03)

$= 62.13$ g (03)

$BaSO_4$ හි පරීක්ෂණාත්මක ස්කන්ධය $= 31.13$ g (03)

% පරිවර්තනය $= \frac{31.13g}{62.13g} \times 100\%$ (03)

$= 50.1\%$ (04)

**(9b(ii): ලකුණු 25)**

<u>විකල්ප පිළිතුර 03</u>

$FeS_2$ 4 mol → $H_2SO_4$ 8 mol → $BaSO_4$ 8 mol

යකඩ පයිරයිට් 20.0g ක $FeS_2$ ස්කන්ධය $= 20.0\, g \times \frac{80}{100}$ (03)

$= 16.0$ g (03)

$FeS_2$ මවුල $= \frac{16.0}{120}$ mol (03)

$H_2SO_4$ හි සෛද්ධාන්තික මවුල $= \frac{16}{120} \times 2$ mol

$H_2SO_4$ හි සෛද්ධාන්තික ස්කන්ධය $= \frac{16}{120} \times 2$ mol $\times$ 98 g mol-1

$= 26.13$ g (03)

$BaSO_4$ මවුල $= \frac{31.13}{233}$ mol

$H_2SO_4$ මවුල $= \frac{31.13}{233}$ mol

$H_2SO_4$ හි පරීක්ෂණාත්මක ස්කන්ධය $= \frac{31.13}{233}$ mol $\times$ 98 g mol-1 (03)

$= 13.09$ g (03)

% පරිවර්තනය $= \frac{13.09g}{26.13g} \times 100\%$ (03)

$= 50.1\%$ (04)

**(9b(ii): ලකුණු 25**



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

(iii) පාංශු ක්ෂුද්‍රජීවීන් මඟින් අයකන් පයිරයිට්වල ඇති $FeS_2$, $SO_4^{2-}$ බවට පරිවර්තනය වන ප්‍රතිශතය 100% වන විට $H_2SO_4$ 8 kg නිපදවීමට අවශ්‍ය වන අයකන් පයිරයිට් ප්‍රමාණය ගණනය කරන්න.
(සාපේක්ෂ පරමාණුක ස්කන්ධ : O = 16, S = 32, Fe = 56, Ba = 137)

$H_2SO_4$ = 8 kg = 8000 g (03)

$H_2SO_4$ හි මවුලික ස්කන්ධය = 98 (03)

$H_2SO_4$ හි මවුල $= \frac{8000}{98}$ (03)

පරිවර්තනය 100% නම්

$\therefore$ අවශ්‍ය $FeS_2$ මවුල $= \frac{8000}{98} \times \frac{1}{2}$ (03)

= 40.8 mol (03)

= 40.8 x 120 g

= 4896 g (03)

$\therefore$ $H_2SO_4$ කිලෝග්‍රෑම් 8 ක් නිපදවීමට අවශ්‍ය යකඩ පයිරයිට් ප්‍රමාණය $= \frac{4896}{80} \times 100$ g (03)

= 6120 g

= 6.12 kg (04)

**(9b(iii): ලකුණු 25)**

10. (a) පහත දී ඇති ප්‍රශ්න සොල්වේ ක්‍රියාවලිය මත පදනම් වේ.

(i) සොල්වේ ක්‍රියාවලියේ ප්‍රධාන ඵලය කුමක් ද?

$Na_2CO_3$/ සෝඩියම් කාබනේට් (04)

(ii) සොල්වේ ක්‍රියාවලියේ ප්‍රධාන අතුරුඵලය කුමක් ද?

$CaCl_2$/ කැල්සියම් ක්ලෝරයිඩ් (04)

(iii) සොල්වේ ක්‍රියාවලියේ යොදාගන්නා අමුද්‍රව්‍යයන් (ආරම්භක ද්‍රව්‍යයන්) මොනවා ද?

$NH_3$ වායුව, (04)

$CO_2$ වායුව (04)

බ්‍රයින් (මුහුදු ජලයෙන් ලබාගන්නා $Ca^{2+}$, $Mg^{2+}$ හා $SO_4^{2-}$ ඉවත් කරන ලද පිරිසිදු කළ සාන්ද්‍ර NaCl ද්‍රාවණයයි) (04)

**(10a(iii): ලකුණු 12)**

(iv) ඉහත (iii) හි සඳහන් කුමන අමුද්‍රව්‍යය මෙම ක්‍රියාවලියේදී වැය නොවී, නැවත නැවතත් ප්‍රතිචක්‍රීකරණය කෙරෙන්නේ ද?

$NH_3$ වායුව (04)

(v) අමුද්‍රව්‍ය සවිවර මැටි තහඩුවලින් සමන්විත අටළුවක් තුළ මිශ්‍ර කරන සොල්වේ ක්‍රියාවලියේ පළමු පියවර හඳුනාගන්න. මෙය පහළ උෂ්ණත්වයකදී සිදු කරන්නේ මන්දැයි පැහැදිලි කරන්න.

- ඇමෝනීකරණය (ප්‍රතිප්‍රවාහ මූලධර්මය භාවිතයෙන් $NH_3$ වායුව හා බ්‍රයින් ද්‍රාවණය මිශ්‍ර කිරීම) (02)
- ඇමෝනීකරණය තාපදායක ක්‍රියාවකි. (03)
- උෂ්ණත්වය වැඩි වුවහොත් $NH_3$ වායුව බ්‍රයින් ද්‍රාවණයේ දියවීමේ කාර්යක්ෂමතාව අඩු වේ. එම නිසා පහළ උෂ්ණත්වයක් පවත්වා ගනී. (03)


Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

හෝ

$NH_3$ වායුව දියවීම තාපදායක ($\Delta H < 0$) සහ (OI) **(01)**
එන්ට්‍රොපි විපර්යාසය ($\Delta S$) සෘණ වේ. ($\Delta S < 0$) **(01)**
$\Delta G = \Delta H - T\Delta S$ අනුව, **(01)**
$\Delta S$ සෘණ වන විට $-T\Delta S$ හි අගය ධන අගයකි. **(01)**
උෂ්ණත්වය වැඩිවන විට හි $\Delta G$ හි සෘණ අගය අඩුවේ. **(01)**
$NH_3$ වායුව දියවීමේ කාර්යක්ෂමතාව අඩුවේ. එම නිසා පහළ උෂ්ණත්වය පවත්වා ගැනීම වඩා සුදුසුය **(03)**

(vi) සොල්වේ ක්‍රියාවලියේ ප්‍රධාන ඵලයේ භාවිත **තුනක්** දෙන්න.

- ජලයේ කඨිනත්වය ඉවත් කිරීමට
- වීදුරු කර්මාන්තයේදී භාවිතා කෙරේ.
- කඩදාසි කර්මාන්තයේ දී භාවිතා කෙරේ.
- සබන් හා ක්ෂාලක නිපදවීමේදී ශෝධන ක්‍රියාව වර්ධනය කිරීමට
- ප්‍රබල පිරිසිදු කාරක (රෙදි සෝඩා) ලෙස භාවිතා කිරීම

**(ඕනෑම තුනක් සඳහා ලකුණු 03 x 03 = ලකුණු 09)**

(vii) සොල්වේ ක්‍රියාවලියේ ආර්ථික ලාභදායිත්වය සඳහා දායක වන හේතු **තුනක්** දෙන්න.

- $NaCl$ හා $CaCO_3$ අඩු වියදමකින් පහසුවෙන් ලබා ගත හැකිවීම
- $NH_3$ වැය නොවන අතර චක්‍රීකරණය මගින් නැවත නැවතත් භාවිතා කළ හැකිවීම
- $CO_2$ වලින් කොටසක් ද නැවත භාවිතා කළ හැකිවීම

**(ලකුණු 03 x 03 = ලකුණු 09)**

(*b*) පහත සඳහන් එක් එක් ප්‍රකාශනය කෙටියෙන් පැහැදිලි කරන්න.

(i) කෘෂිකර්මය ගෝලීය උණුසුමට දායක වේ.

කෘෂිකර්මාන්තයේ දී,

- ගෝලීය උණුසුමට දායක වන <u>$N_2O$</u> (**ලකුණු** 02) හා <u>$CH_4$</u> (**ලකුණු** 02) වායු නිපදවයි.
- මෙම වායූන් දෙකම හරිතාගාර වායූන් වේ. **(02)**
- මෙම වායූන් හි සාන්ද්‍රණය ඉහළ යාම ගෝලීය උණුසුමට හේතු වේ. **(02)**

$N_2O$ සෑදීම

- පොහොර වශයෙන් පසට එකතු කරන නයිට්‍රජන් සංයෝග මත **(02)**
- නයිට්‍රිහාරී බැක්ටීරියා ක්‍රියාකාරිත්වයෙන් $N_2O$ නිපදවයි. **(02)**

$CH_4$ සෑදීම

- වගුරු බිම් සහ ජලයෙන් යට වූ ප්‍රදේශවල වී වගාව **(02)**
- කාබනික ද්‍රව්‍ය නිර්වායු වියෝජනය මගින් $CH_4$ නිපදවීමට හිතකර වේ. **(01)**
- අවිධිමත් ලෙස බැහැර කරන කාබනික ද්‍රව්‍ය දිරාපත් වීම. **(02)**
- නිර්වායු වියෝජනයට ලක් වී $CH_4$ නිපදවයි. **(01)**
- වමාරා කන සතුන්ගේ (එළදෙනුන්, එළුවන්, බැටළුවන්) බඩවැල්වල කාබනික/සෙලියුලෝස් ද්‍රව්‍ය ජීර්ණයේ දී සිදුවන නිර්වායු තත්වයන් යටතේ බැක්ටීරියා වියෝජනයේදී $CH_4$ නිපදවයි. **(02)**

**(10b(i): ලකුණු 20)**


Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

(ii) යකඩ නිස්සාරණය ගෝලීය උණුසුමට දායක වේ.

යකඩ නිස්සාරණයට අදාළව:

- $CO_2$ ගෝලීය උණුසුමට දායක වේ
- $CO_2$ හරිතාගාර වායුවක් වන අතර
- සාන්ද්‍රණය වැඩිවීම ගෝලීය උණුසුමට දායක වේ

**(02x3)**

$CO_2$ සෑදීම:

යකඩ නිස්සාරණය සඳහා භාවිතා කරන පොසිල ඉන්ධන සහ කෝක් දහනය කිරීමේදී $CO_2$ බවට පරිවර්තනය වේ **(04)**

**(10b(ii): ලකුණු 10)**

(iii) ප්‍රවාහනය ප්‍රකාශ රසායනික ධූමිකාවට දායක වේ.

ඉහත සඳහන් එක් එක් ප්‍රකාශයේ දී ඇති පාරිසරික ආවරණවලට වගකිව යුතු රසායනික විශේෂය/විශේෂ සෑදෙන්නේ කෙසේදැයි ඔබගේ පිළිතුරෙහි දක්වන්න.

ප්‍රවාහනයට අදාළව:

ප්‍රකාශ රසායනික දුමාරයට දායක වන විශේෂ

NO සහ වාෂ්පශීලී හයිඩ්‍රොකාබන ($CH_3(CH_2)_nCH_3$, n = 1-4) **(02x2)**

- NO සහ වාෂ්පශීලී හයිඩ්‍රොකාබන සූර්යාලෝකය හමුවේ ප්‍රතික්‍රියා වලට භාජනය වී වාෂ්පශීලී කෙටි දාම ඇල්ඩිහයිඩ සහ අනෙකුත් විෂ රසායනික ද්‍රව්‍ය (PAN, PBN) නිපදවයි
- වායුගෝලයේ අවලම්බනය වන අංශු නිපදවීම සඳහා ඇල්ඩිහයිඩ තවදුරටත් බහුඅවයවීකරණය වේ
- මෙම අංශු දූවිලි, ජල වාෂ්ප ආදිය තැන්පත් වීමෙන් විශාල අංශු සෑදිය හැක
- මෙම විශාල අංශු මගින් වායුගෝලයේ පාරදෘශ්‍යතාව/විනිවිදභාවය අඩු කරමින් සූර්ය ආලෝකය ප්‍රකිරණය කළ හැකි අතර පහළ වායුගෝලයේ මීදුමක් මෙන් දිස් වේ

**(02 x 8 = 16)**

**(10b(iii): ලකුණු 20)**

**10(b): ලකුණු 50**



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

(c) (i) පහත දැක්වෙන ප්‍රශ්න විනාකිරි නිෂ්පාදනය මත පදනම් වේ.

I. ස්වභාවික විනාකිරි නිෂ්පාදනයේදී භාවිත කරන ක්‍රියාවලිය කුමක්දැයි සඳහන් කරන්න.

ක්‍ෂුද්‍රජීවී ක්‍රියාකාරිත්වය / ක්‍ෂුද්‍රජීවී පැසවීම **(04)**

II. ස්වභාවික විනාකිරිවල අඩංගු ක්‍රියාකාරී රසායනික සංඝටකයේ (active chemical ingredient) නම ලියන්න.

ඇසිටික් අම්ලය **(04)**

III. ස්වභාවික විනාකිරිවල අඩංගු ක්‍රියාකාරී රසායනික සංඝටකය ප්‍රමාණාත්මකව විශ්ලේෂණය කිරීමේදී යොදාගන්නා අනුමාපකය සහ දර්ශකය නම් කරන්න.

**අනුමාපකය** - NaOH **(04)**

**දර්ශකය** - පිනෝප්තලීන් (Phenolphthalein) **(04)**

IV. ස්වභාවික විනාකිරි සහ කෘත්‍රිම විනාකිරිවල සංයුති අතර වෙනස කුමක්දැයි සඳහන් කරන්න.

ස්වාභාවික විනාකිරි වල <u>ලවණ</u>, <u>සරල සීනි</u>, <u>එස්ටර</u> සහ <u>මධ්‍යසාර</u> කුඩා ප්‍රමාණවලින් අඩංගු වේ. **(01x4)**

කෙසේ වෙතත්, කෘතිම විනාකිරි වල අඩංගු වන්නේ ඇසිටික් අම්ලය පමණි. **(02)**

(ii) පහත සඳහන් ප්‍රශ්න ශාකවලින් සගන්ධ තෙල් නිස්සාරණය මත පදනම් වේ.

I. සගන්ධ තෙල් නිස්සාරණයට භාවිත කළ හැකි ක්‍රම තුනක් නම් කරන්න.

හුමාල ආසවනය
ද්‍රාවක නිස්සාරණය
තෙරපීම

(ලකුණු 04 x 3 = ලකුණු 12

II. ඉහත ක්‍රමවලින් ඩෝල්ටන්ගේ ආංශික පීඩන නියමය යෙදීම මත පදනම් වූ ක්‍රමය කුමක්දැයි සඳහන් කරන්න.

හුමාල ආසවනය (ලකුණු 04)

III. පහත සඳහන් එක් එක් සගන්ධ තෙලෙහි අඩංගු ප්‍රධාන සංයෝගය නම් කරන්න.

- පැඟිරි තෙල් (Citronella oil)
- කුරුඳු මුල් තෙල්
- කුරුඳු පත්‍ර තෙල්

පැඟිරි තෙල් - ජෙරනියෝල්
කුරුඳු මූල - කැම්පර්
කුරුඳු කොළ - ඉයුජිනෝල්

(ලකුණු 04 x 3 = ලකුණු 12)

**10(c): ලකුණු 50**

***



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/